# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 59 දරන
# ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1979 සැප්තැම්බර් මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 සැප්තැම්බර් මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. 1.00 යි　　　　තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1979 අංක 59 දරන ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1979 සැප්තැම්බර් මස 25 වන දින]

එල්. ඩී.—ඕ. 66/77.

**ශ්‍රී ලංකා ජලතීරයෙහි විදේශීය ධීවර බෝට්ටු මගින් මසුන් ඇල්ලීම හා ඊට අදාළ කටයුතු විධිමත් කිරීම, පාලනය කිරීම සහ කළමනාකරණය කිරීම පිණිස ද ඒ හා සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලසීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1979 අංක 59 දරන ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

## I වන කොටස—ක්‍රියාවේ යෙදවීම

**2.** මේ පනත ක්‍රියාවේ යෙදවීම සඳහා සහ එහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂවරයා වගකිව යුතු වන්නේ ය. පනත ක්‍රියාවේ යෙදවීම.

**3.** මේ පනත නිසි ලෙස බලාත්මක කිරීම තහවුරු කිරීමටත් ශ්‍රී ලංකා ජලතීරයෙහි විදේශීය ධීවර බෝට්ටු මගින් මසුන් ඇල්ලීමේ සහ ඊට අදාළ කටයුතු ප්‍රවික්ෂණය කිරීමේ ඵලදායී ක්‍රමයක් ඇති කොට පවත්වා ගෙන යාමටත් අවශ්‍ය වන්නා වූ සියලු ආකාරයෙන් වූ සහාය සන්නද්ධ සේවාවන්හි හමුදාපතිවරයන් විසින් ලබා දිය යුතු ය. මේ පනත ක්‍රියාත්මක කිරීමේ දී හා බලාත්මක කිරීමේ දී සන්නද්ධ සේවා සහයෝග විය යුතු බව.

## II වන කොටස—ශ්‍රී ලංකා ජලතීරයෙහි විදේශීය ධීවර බෝට්ටු විසින් මසුන් ඇල්ලීම හා ඊට අදාළ කටයුතු පාලනය කිරීම

**4.** 12 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, 6 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක අධිකාරය යටතේ හැර, ශ්‍රී ලංකා ජල තීරයෙහි මසුන් ඇල්ලීමේ හෝ ඊට අදාළ කටයුතු සඳහා කිසිම විදේශීය ධීවර බෝට්ටුවක් පාවිච්චි කරනු නොලැබිය යුතු ය. විදේශීය ධීවර බෝට්ටු මගින් මසුන් ඇල්ලීම හා ඊට අදාළ කටයුතු කිරීම තහනම් කිරීම.

**5.** 6 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක අධිකාරය යටතේ හැර, අන්‍යාකාරයකින් ශ්‍රී ලංකා ජලතීරයට යම් විදේශීය ධීවර බෝට්ටුවක් ඇතුළුවන අවස්ථාවක ඒ බෝට්ටුව ඒ ජල තීරයෙහි තිබෙන සෑම වේලාවක දී ම, ඒ බෝට්ටුවේ ධීවර ආම්පන්න නියමිත ආකාරයට තැන්පත් කොට තබනු ලැබිය යුතු ය. අවසර පත්‍රයක් නොමැතිව ශ්‍රී ලංකා ජල තීරයට ඇතුළුවන විදේශීය ධීවර බෝට්ටු ධීවර ආම්පන්න තැන්පත් කොට තැබිය යුතු බව.

**6.** (1) අවසර පත්‍රයක් සඳහා කරන ලද ඉල්ලීමක් මත සහ නියමිත ගාස්තුව ගෙවීම මත, එසේම අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව අධ්‍යක්ෂවරයා විසින් හෝ ඒ සඳහා ඔහු විසින් විශේෂයෙන් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින්, අවසර පත්‍රයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ශ්‍රී ලංකා ජල තීරයෙහි යම් ප්‍රදේශයක හෝ ප්‍රදේශයන්හි සහ අවසර පත්‍රයෙහි එසේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි කාලසීමා තුළ එසේම සඳහන් කරනු ලැබිය හැකි විදේශීය ධීවර බෝට්ටු අවසර පත්‍ර.

2—ඒ 43690—11,700 (79/08)

ආකාරයක මසුන් ඇල්ලීම සහ ඊට අදාළ කටයුතු සඳහා යම් බෝට්ටුවක් පාවිච්චි කිරීමට බලය දෙමින් යම් විදේශීය ධීවර බෝට්ටුවක් සම්බන්ධයෙන් අවසර පත්‍රයක් දෙනු ලැබිය හැකි ය. එවැනි සෑම අවසර පත්‍රයක්ම නියමිත ආකෘතියෙහි විය යුතු ය.

(2) අවසර පත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලීමක් ම අධ්‍යක්ෂවරයා වෙත නියමිත ආකෘති පත්‍රයක් මගින් ඉදිරිපත් කළ යුතු අතර, නියමිත විස්තර එහි ඇතුළත් විය යුතු ය.

*ශ්‍රී ලංකාවේ ධීවරයන් විසින් සහ දේශීය ධීවර බෝට්ටු මගින් මසුන් ඇල්ලීම සඳහා ශ්‍රී ලංකා ජල තීරයෙහි ප්‍රදේශ අමාත්‍යවරයා විසින් වෙන් කළ හැකි බව.*

7. (1) ශ්‍රී ලංකාවේ ධීවරයන් විසින් සහ දේශීය ධීවර බෝට්ටු මගින් මසුන් ඇල්ලීම සඳහා වෙන් කොට තැබිය යුතු ශ්‍රී ලංකා ජල තීරයෙහි ප්‍රදේශ අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

(2) 6 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන කිසිම අවසර පත්‍රයකින් මේ වගන්තියේ කාර්ය සඳහා නියම කරනු ලැබූ යම් ප්‍රදේශයක් තුළ යම් විදේශීය ධීවර බෝට්ටුවක් මගින් මසුන් ඇල්ලීම සඳහා හෝ ඊට අදාළ කටයුතු සඳහා හෝ බලය නොදිය යුතු ය; නැතහොත් වලංගු නොවිය යුතු ය.

*විදේශීය ධීවර බෝට්ටු අවසර පත්‍රවල කොන්දේසි.*

8. 6 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයක් ම නියම කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට සහ අවසර පත්‍රය නිකුත් කරනු ලැබ ඇත්තේ යම් කාලයක් සඳහා ද ඒ කාලය ද, විදේශීය ධීවර බෝට්ටුවකට මසුන් ඇල්ලීමටත් ඊට අදාළ කටයුතුවලටත් ඒ අවසර පත්‍රයෙන් බලය දෙනු ලැබූ ප්‍රදේශ ද, එවැනි බෝට්ටුවක් මගින් යොදාගනු ලබන මසුන් ඇල්ලීමේ ක්‍රම සහ පාවිච්චි කරනු ලබන ධීවර ආම්පන්න වර්ගයද සැලකිල්ලට ගෙන එවැනි අවසර පත්‍රයකට අනුයුක්ත කිරීම සුදුසු යයි අධ්‍යක්ෂවරයා අදහස් කරන (මෙහි මින් මතු “විශේෂ කොන්දේසි” යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් කොන්දේසිවලට යටත් විය යුතු ය.

*අවසර පත්‍රයෙහි ඇතැම් කොන්දේසි වෙනස් කිරීමෙහි ලා අධ්‍යක්ෂවරයාගේ බලය.*

9. (1) ශ්‍රී ලංකා ජල තීරයෙහි ධීවර කටයුතු නිසි ලෙස කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය යයි නැතහොත් අවස්ථාවෝචිත යයි අධ්‍යක්ෂවරයා සෑහීමට පත්වන අවස්ථාවක, 6 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ යම් අවසර පත්‍රයකට අනුයුක්ත යම් විශේෂ කොන්දේසි ඔහු විසින් කලින් කල වෙනස් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් තමා වෙත පවරනු ලැබූ බල තල අනුව කටයුතු කිරීමේ දී, 6 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ යම් අවසර පත්‍රයකට අනුයුක්ත යම් විශේෂ කොන්දේසියක් අධ්‍යක්ෂවරයා විසින් වෙනස් කරනු ලබන අවස්ථාවක, හැකිතාක් ඉක්මණින් ඒ අවසර පත්‍රය දරන්නාට ඒ වෙනස් කිරීම පිළිබඳව දැනුම් දීමට ඔහු විසින් සලස්වනු ලැබිය යුතු ය.

*අවසර පත්‍ර අත් හිටුවීමට හෝ අවලංගු කිරීමට අධ්‍යක්ෂවරයාට ඇති බලය.*

10. (1) (අ) අවසර පත්‍රය නිකුත් කරනු ලැබුවේ යම් විදේශීය ධීවර බෝට්ටුවක් සම්බන්ධයෙන් ද ඒ විදේශීය ධීවර බෝට්ටුව, මේ පනතේ විධිවිධාන හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ ඒ අවසර පත්‍රයට අනුයුක්ත යම් කොන්දේසියක් හෝ කඩ කරමින් පාවිච්චි කරනු ලැබ ඇති බවට තමා සෑහීමට පත්වන අවස්ථාවක ; නැතහොත්

(ආ) ශ්‍රී ලංකා ජල තීරයෙහි ධීවර කටයුතු නිසි ලෙස කළමනාකරණය කිරීම සඳහා අවසර පත්‍රයක් අත්හිටුවීම හෝ අවලංගු කිරීම අවශ්‍ය හෝ යෝග්‍ය බවට තමා සෑහීමට පත්වන අවස්ථාවක

6 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ යම් අවසර පත්‍රයක් අත්හිටුවමින් අධ්‍යක්ෂවරයා විසින් නියමයක් කරනු ලැබිය හැකි ය. නැතහොත් ඒ අවසර පත්‍රය අවලංගු කරනු ලැබිය හැකි ය. මේ උප වගන්තිය යටතේ කරන ලද සෑම නියමයක ම ඒ සඳහා හේතු දැක්විය යුතු ය.

(2) (1) (ආ) උපවගන්තියෙහි සඳහන් හේතු මත යම් අවසර පත්‍රයක් අත්හිටුවනු ලබන හෝ අවලංගු කරනු ලබන අවස්ථාවක, එවැනි අවසර පත්‍රයක් වෙනුවෙන් ගෙවන ලද ගාස්තුවේ ඒ අවසර පත්‍රය නිකුත් කරන ලද කාලසීමාවෙන් ඉකුත් නොවූ කාලසීමාවට සමානුපාතික කොටස, අවසර පත්‍රය දරන්නාගේ ඉල්ලීම මත, ඔහුට ආපසු ගෙවනු ලැබිය යුතු ය. එවැනි යම් ඉල්ලීමක්—

(අ) අවසර පත්‍රය අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ නියමයේ දින සිට දින හැටක් ඇතුළත ; හෝ

(ආ) අවසර පත්‍රයක් අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ නියමයකට විරුද්ධව අමාත්‍යවරයාට යම් ආයාචනයක් කරන ලද අවස්ථාවක ඒ ආයාචනය සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ තීරණයේ දින සිට දින තිහක් ඇතුළත ; හෝ

අධ්‍යක්ෂවරයා වෙත ලිඛිතව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**අමාත්‍යවරයා වෙත ආයාචනා.**

**11.** (1) 10(1) වන වගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් කරන ලද නියමයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ඒ නියමය කිරීමේ දින සිට දින තිහක් ඇතුළත ඊට විරුද්ධව අමාත්‍යවරයා වෙත ආයාචනය කළ හැකි ය. එම ආයාචනය පිළිබඳ අමාත්‍යවරයාගේ තීරණය අවසානාත්මක විය යුතු ය.

(2) 9(1) වන වගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් කරන ලද වෙනස් කිරීමක් හෝ 10(1) වන වගන්තිය යටතේ කරන ලද අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ කිසිම නියමයක් හෝ (1) වන උප වගන්තිය යටතේ අමාත්‍යවරයාගේ තීරණයක්, අවස්ථාවෝචිත පරිදි ඒ වෙනස් කිරීම, අත්හිටුවීම, අවලංගු කිරීම හෝ තීරණය කිරීම ශ්‍රී ලංකා ජල තීරයෙහි ධීවර කටයුතු නිසි ලෙස කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය නොවේය නැතහොත් යෝග්‍ය නොවේය යන හේතුව මත යම් අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

**පර්යේෂණ හෝ විද්‍යාත්මක කාර්යයන් සඳහා මසුන් ඇල්ලීම.**

**12.** (1) ශ්‍රී ලංකා ජල තීරයෙහි ධීවර සම්පත්වලට අදාළ පර්යේෂණ මෙහෙයුම්, අත්හදා බැලීමක් වශයෙන් කරනු ලබන මසුන් ඇල්ලීම හෝ විද්‍යාත්මක විමර්ශණ සඳහා පාවිච්චි කරනු ලැබීමට යම් විදේශීය ධීවර බෝට්ටුවකට බලය දෙමින් අධ්‍යක්ෂවරයා විසින් ලිඛිත අවසරයක් දිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ තම ලිඛිත අවසරය දීමේ දී ඒ විදේශීය ධීවර බෝට්ටුව පාවිච්චි කිරීම සඳහා බලය දෙනු ලබන ඒ පර්යේෂණ මෙහෙයුම්, අත්හදා බැලීමක් වශයෙන් කරනු ලබන මසුන් ඇල්ලීම හෝ විද්‍යාත්මක විමර්ශණ පවත්වාගෙන යාම සම්බන්ධයෙන් සුදුසු යයි තමා කල්පනා කරන කොන්දේසි අධ්‍යක්ෂවරයා විසින් අනුයුක්ත කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් දෙන ලද ලිඛිත අවසරයේ අධිකාරය යටතේ සහ ඒ අනුව මෙහෙයවනු ලබන යම් බෝට්ටුවකට 4 වන වගන්තියේ හෝ 5 වන වගන්තියේ කිසිවක් අදාළ නොවිය යුතු ය.

(4) පොදු යහපත සඳහා යම් පරිච්ඡින්න කිරීමක් හෝ වෙනස් කිරීමක් අවශ්‍ය යයි අධ්‍යක්ෂවරයා විසින් සලකනු ලබන යම් අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ දෙන ලද යම් ලිඛිත අවසරයක් පරිච්ඡින්න කිරීම හෝ ඒ අවසරයෙහි අනුයුක්ත කොන්දේසි වෙනස් කිරීම හෝ ඔහු විසින් කරනු ලැබිය හැකි ය.

## III වන කොටස—බලය ලත් නිලධරයන්ගේ බලතල

බලය ලත් නිලධරයන්ගේ බලතල.

13. (1) මේ පනත බලාත්මක කිරීමේ කාර්ය සඳහා බලය ලත් යම් නිලධරයකු විසින්—

(අ) ශ්‍රී ලංකා ජල තීරය තුළ වූ යම් විදේශීය ධීවර බෝට්ටුවක් නැවැත්වීම, ඊට ගොඩ වීම සහ එය සෝදිසි කිරීම ;

(ආ) මේ පනතින් හෝ ඒ යටතේ හෝ තබා ගැනීමට නැතහොත් පවත්වා ගෙන යාමට නියම කරනු ලැබූ යම් අවසර පත්‍රයක්, ලොග් පොතක් හෝ වෙනත් ලේඛනයක් ඉදිරිපත් කිරීමට නියම කිරීම, පරීක්ෂා කිරීම සහ එහි පිටපත් ගැනීම ;

(ඇ) ඒ බෝට්ටුවෙහි ඇති හෝ බෝට්ටුවට අයත් යම් මාළු දැල් හෝ වෙනත් ධීවර ආම්පන්න ඉදිරිපත් කිරීමට නියම කිරීම සහ පරීක්ෂා කිරීම සහ ඒ බෝට්ටුවෙහි ඇති යම් මසුන් හෝ ජලජ ශාක පරීක්ෂා කිරීම ; සහ

(ඈ) මේ පනත යටතේ යම් වරදක් සිදු කරනු ලැබ ඇත්තේ දැයි නිශ්චය කිරීම පිණිස ඒ බෝට්ටුවේ යාත්‍රාධිපතිගෙන් සහ එහි සේවක පිරිසගෙන් අවශ්‍ය විය හැකි අන්දමේ විමර්ශණ කිරීම

කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත යටතේ යම් වරදක් සිදු කර ඇති බව විශ්වාස කිරීමට තමාට සාධාරණ හේතු ඇති අවස්ථාවක, යම් බලය ලත් නිලධරයකු විසින් වරෙන්තුවක් ඇතිව හෝ නොමැතිව—

(අ) යම් බෝට්ටුවක ඇති හෝ බෝට්ටුවට අයත් යම් ධීවර ආම්පන්න, මසුන් හෝ ජලජ ශාක, උපකරණ, ගබඩා ගත බඩු සහ යාත්‍රා බඩු ඇතුළුව වරද කිරීමේ දී හෝ ඒ සම්බන්ධයෙන් හෝ පාවිච්චි කරනු ලැබූ යම් බෝට්ටුවක් තහනමට ගෙන රඳවා තබනු ලැබිය හැකි ය. නැතහොත් බෝට්ටුව විසින් අත්හැර දමන ලද යම් ධීවර ආම්පන්න තහනමට ගනු ලැබිය හැකි ය ; තව ද

(ආ) ඒ වරද සිදු කළා යයි විශ්වාස කිරීමට තමාට හේතු ඇති යම් තැනැත්තකු සිර භාරයට ගත හැකි ය.

(3) මේ වගන්තිය යටතේ බෝට්ටුවක් තහනමට ගැනීම ක්‍රියාත්මක කිරීමේ දී බලය ලත් නිලධරයකු විසින් සාධාරණ ලෙස අවශ්‍ය වන ප්‍රමාණයට බලය පාවිච්චි කළ හැකි ය.

(4) මේ වගන්තිය යටතේ තහනමට ගනු ලැබූ යම් විදේශීය ධීවර බෝට්ටුවක් සහ එහි සේවක පිරිස ශ්‍රී ලංකාවේ ආසන්නතම හෝ ඉතාමත්ම පහසු වරායට ගෙන එනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ යම් විදේශීය ධීවර බෝට්ටුවක් හෝ වෙනත් දෙයක් තහනමට ගෙන ඇති අවස්ථාවක, ඒ බෝට්ටුව හෝ වෙනත් දෙය තහනමට ගනු ලැබුවේ යම් බලය ලත් නිලධරයකු විසින් ද ඒ නිලධරයා විසින් හැකිතාක් ඉක්මණින් ඒ බෝට්ටුව හෝ වෙනත් දෙය මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය; නැතහොත් බෝට්ටුව හෝ වෙනත් දෙය මහාධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් පරීක්ෂා කිරීමට සැලැස්විය යුතු ය. ඒ බෝට්ටුව හෝ වෙනත් දෙය සම්බන්ධයෙන් පවරනු ලැබූ නඩුවක් අවසාන වනතෙක් ඒ බෝට්ටුව හෝ වෙනත් දෙය රඳවා තැබීමට හෝ අත්අඩංගුවට ගැනීමට අදාළ, මහාධිකරණ විනිශ්චයකාරවරයා සුදුසු යයි සලකනු ලබන ආඥාවක් ඒ අධිකරණය විසින් කළ යුතු ය:

එසේ වුව ද එසේ තහනමට ගනු ලැබූ යම් මසුන් හෝ ජලජ ශාක ඉක්මණින් නරක් වන සුළු ඒවා වන අවස්ථාවක බලය ලත් නිලධරයකු විසින් අධ්‍යක්ෂවරයාගේ හෝ දිසාපතිවරයාගේ විධානය අනුව ඒ මසුන් හෝ ජලජ ශාක විකිණිය හැකි අතර විකිණීමෙන් ලත් ඒ මුදල මහාධිකරණයෙහි තැන්පත් කරනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ සිරභාරයට ගනු ලැබූ සෑම තැනැත්තකු ම (වරෙන්තුවක් යටතේ වූ සිරභාරයට ගැනීමක් සම්බන්ධයෙන් වූ විට ඒ වරෙන්තුවෙහි යම් පිටසන් කිරීමකට යටත්ව) ඒ තැනැත්තා සිරභාරයට ගැනීම සඳහා හේතු දක්විය යුතු අතර සිරභාරයට ගනු ලැබූ ස්ථානයේ සිට මහාධිකරණ විනිශ්චයකාරවරයා හමුවට පැමිණ වීම දක්වා ගමන සඳහා අවශ්‍ය කාලය හැර සිරභාරයට ගැනීමේ සිට පැය විසිහතරක් ඇතුළත මහාධිකරණ විනිශ්චයකාරවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(7) ශ්‍රී ලංකා ජල තීරයෙහි යම් විදේශීය ධීවර බෝට්ටුවක් විසින් මේ පනත යටතේ හෝ ධීවර කටයුතුවලට අදාළ වෙනත් යම් පනතක් යටතේ යම් වරදක් සිදු කිරීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා ජල තීරයෙන් ඔබ්බට ඒ විදේශීය ධීවර බෝට්ටුව ලුහු බඳිනු ලැබූ අවස්ථාවක, ජාත්‍යන්තර නීතියෙන් පිළිගනු ලබන අවස්ථානුගත කරුණු අනුව, සහ එසේ පිළිගනු ලබන ප්‍රමාණයට මේ වගන්තියෙන් බලය ලත් නිලධරයන් වෙත පවරා ඇති බලතල ශ්‍රී ලංකා ජල තීරයේ සීමාවෙන් ඔබ්බෙහි ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

නඩු පැවරීමෙන් ආරක්ෂාව.

**14.** (1) මේ පනතේ යම් විධිවිධානයක් ක්‍රියාවට නැඟීමේ දී සද්භාවයෙන් කරන ලද හෝ කරනු ලැබීමට සද්භාවයෙන් නියම කරන ලද යම් ක්‍රියාවක් සඳහා, යම් සිවිල් අධිකරණයක දී ශ්‍රී ලංකා ආණ්ඩුවට හෝ යම් බලය ලත් නිලධරයකුට හෝ විරුද්ධව හානි සඳහා කිසිම නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) බලය ලත් නිලධරයකු විසින් කරන ලද, මේ පනතේ යම් විධිවිධානයක් ක්‍රියාවට නැඟීමක් යයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් එසේ පැමිණිලි කරනු ලැබූ ඒ ක්‍රියාවේ දින සිට මාස හයක් ඇතුළත ඒ නඩුව පවරනු ලැබුවේ නම් මිස, යම් අධිකරණයක් විසින් ඒ නිලධරයාට විරුද්ධව කිසිම නඩුවක් භාරගනු නොලැබිය යුතු ය.

## IV වන කොටස

## වැරදි

4 වන වගන්තියේ හෝ 5 වන වගන්තියේ විධිවිධාන කඩ කිරීම වරදක් බව.

**15.** 4 වන වගන්තියේ හෝ 5 වන වගන්තියේ විධිවිධාන කඩ කරමින් යම් විදේශීය ධීවර බෝට්ටුවක් පාවිච්චි කරනු ලබන අවස්ථාවක, ඒ බෝට්ටුවේ යාත්‍රාධිපති, අයිතිකරු සහ කුලියට ගත් තැනැත්තෙක් ඇතොත් ඒ තැනැත්තා යන එක් එක් තැනැත්තා මේ පනත යටතේ වරදක් කරන අතර, ජූරි සභාවක් නොමැතිව මහාධිකරණ විනිශ්චයකාරවරයකු ඉදිරියේ නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට—

(අ) 4 වන වගන්තිය කඩ කිරීමක් සම්බන්ධයෙන් වන විට, රුපියල් පහළොස් ලක්ෂයක් නොඉක්මවන දඩයකට; හෝ

(ආ) 5 වන වගන්තිය කඩ කිරීමක් සම්බන්ධයෙන් වන විට රුපියල් හත් ලක්ෂ පනස්දහසක් නොඉක්මවන දඩයකට

ඒ එක් එක් තැනැත්තා යටත් විය යුතු ය.

අවසර පත්‍රයේ කොන්දේසි නොපිළිපැදීම වරදක් බව.

**16.** 6 වන වගන්තිය යටතේ අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබුවේ යම් විදේශීය ධීවර බෝට්ටුවක් සම්බන්ධයෙන් ද ඒ ධීවර බෝට්ටුව ඒ අවසර පත්‍රයේ කොන්දේසි කඩ කරමින් පාවිච්චි කරනු ලබන අවස්ථාවක, ඒ බෝට්ටුවේ යාත්‍රාධිපති, අයිතිකරු සහ කුලියට ගත් තැනැත්තෙක් ඇතොත් ඒ තැනැත්තා යන එක් එක් තැනැත්තා මේ පනත යටතේ වරදක් කරන අතර, ජූරි සභාවක් නොමැතිව මහාධිකරණ විනිශ්චයකාරවරයකු ඉදිරියේ නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් හත්ලක්ෂ පනස් දහසක් නොඉක්මවන දඩයකට ඒ එක් එක් තැනැත්තා යටත් විය යුතු ය.

බලයලත් නිලධරයන්ට බාධා කිරීම.

**17.** (අ) මේ පනතින් තමා වෙත පවරනු ලැබූ යම් බලතල ක්‍රියාත්මක කිරීමේ දී යම් බලයලත් නිලධරයකුට හිතාමතාම ම බාධා කරන්නා වූ; හෝ

(ආ) (i) මේ පනතින් හෝ ඒ යටතේ හෝ පවත්වාගෙන යනු ලැබීමට නියමිත යම් අවසර පත්‍රයක්, ලොග් පොතක් හෝ වෙනත් ලේඛනයක් ; නැතහොත්

(ii) විදේශීය ධීවර බෝට්ටුවක වූ හෝ විදේශීය ධීවර බෝට්ටුවකට අයත් යම් මාළු දල් හෝ ධීවර ආම්පන්න

බලයලත් නිලධරයකු විසින් ඉදිරිපත් කිරීමට නියම කරනු ලැබූ විට එසේ ඉදිරිපත් කිරීම පැහැර හරින්නා වූ; හෝ

(ඇ) මේ පනතේ විධිවිධාන අනුව බලයලත් නිලධරයකු විසින් කරන ලද යම් විමසුමකට පිළිතුරු සැපයීම පැහැර හරින්නා වූ නැතහොත් නියම කිරීමක් පිළිපැදීම පැහැර හරින්නා වූ

යම් තැනැත්තකු, මේ පනත යටතේ වරදක් කරන අතර ජූරි සභාවක් නොමැතිව මහාධිකරණ විනිශ්චයකාරවරයකු ඉදිරියේ නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් විසිපන් දහසක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

18. මේ පනත යටතේ වරදකට යම් තැනැත්තකු වරදකරු කරනු ලබන අවස්ථාවක අධිකරණය විසින්— රාජසන්තක කිරීම සඳහා ආඥාවක් කිරීමට අධිකරණය සතු බලය.

(අ) යම් බෝට්ටුවක වූ ධීවර ආම්පන්න, උපකරණ, ගබඩාගත බඩු, යාත්‍රා බඩු සහ එවැනි බෝට්ටුවක වූ යම් මසුන් හෝ ජලජ ශාක සහ 13(5) වන වගන්තියේ අතුරු වගන්තිය යටතේ අධිකරණයෙහි තැන්පත් කරනු ලැබූ මසුන් හෝ ජලජ ශාක විකිණීමෙන් ලත් මුදල් සමග වරද සිදුකිරීමේ දී හෝ ඒ සම්බන්ධයෙන් පාවිච්චි කරනු ලැබූ යම් බෝට්ටුවක් රාජසන්තක කළ යුතු බවට ආඥාවක් කරනු ලැබිය හැකි අතර, 4 වන වගන්තිය කඩ කිරීමක් සම්බන්ධයෙන් වන විට, ඉහත සඳහන් ආඥාවක් කරනු ලැබිය යුතු ය;

(ආ) ඒ බෝට්ටුව රඳවා තැබීමේ දී දරන ලද වියදම් සහ ඒ බෝට්ටුවේ සේවක පිරිසේ යම් සාමාජිකයකු හෝ සාමාජිකයන් පෙරළා සිය රට යැවීමේ දී දරන ලද යම් වියදම් වරදකරු කරනු ලැබූ තැනැත්තා විසින් ගෙවිය යුතු බවට ආඥාවක් කළ යුතු ය.

19. (1) 18 වන වගන්තිය යටතේ රාජසන්තක කරනු ලැබූ යම් බෝට්ටුවක්, ධීවර ආම්පන්න, මසුන්, ජලජ ශාක, උපකරණ, ගබඩාගත බඩු හෝ යාත්‍රා බඩු ඒ රාජසන්තක කිරීම මත නිරපේක්ෂ වශයෙන් රජය සතු වන්නේ ය:— රාජසන්තක කරනු ලැබූ බඩු බැහැර කිරීම.

(අ) ඒ රාජසන්තක කිරීමේ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැක්කේ යම් කාලයක් ඇතුළත ද ඒ කාලය ඉකුත්වීමෙන් පසු; හෝ

(ආ) රාජසන්තක කිරීමේ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ රාජසන්තක කිරීමේ ආඥාව ස්ථිර කරමින් හෝ සනාථ කරමින් තීරණය කරනු ලැබූ විට,

ඒ සතු කිරීම ක්‍රියාත්මක විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ රජය සතු කරනු ලැබූ යම් බෝට්ටුවක, ධීවර ආම්පන්න, මසුන්, ජලජ ශාක, උපකරණ, ගබඩා ගත බඩු හෝ යාත්‍රා බඩු සම්බන්ධයෙන් සන්තකය අධ්‍යක්ෂවරයා විසින් ගනු ලැබිය යුතු අතර, සුදුසු යයි ඔහු විසින් කල්පනා කරන අන්දමට ඒවා විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම කළ හැකි ය.

පැරදි සමථයට පත් කිරීම.

20. (1) මේ පනත යටතේ වූ යම් වරදක් සිදු කරනු ලැබුවේ යම් අවස්ථානුගත කරුණු අනුව ද ඒ අවස්ථානුගත කරුණු කෙරෙහි සැලකිලිමත්ව ඒ වරද සඳහා නියම කළ හැකි උපරිම දඩයෙන් පහෙන් එක් කොටසකට නොඅඩු ව්‍යා මුදලකට සමාන මුදලක් ගෙවීම මත, අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව අධ්‍යක්ෂවරයා, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා හෝ දිසාපතිවරයකු හෝ අතිරේක දිසාපති වරයකු විසින් ඒ වරද සමථයට පත් කරනු ලැබිය හැකි ය. තව ද, 13 වන වගන්තිය යටතේ තහනමට ගන්නා ලද (මහාධිකරණ විනිශ්චයකාරවරයකු විසින් කරන ලද රඳවා තැබීමේ ආඥාවකට යටත් නොවූ) යම් බෝට්ටුවක, එහි ඇති මසුන්ගේ හෝ වෙනත් දෙයෙහි ඇස්තමේන්තු කළ වටිනාකමෙහි ද ඒ බෝට්ටුව රඳවා තැබීම සහ එහි සේවක පිරිස පෙරළා සියරට යැවීම සම්බන්ධයෙන් දරන ලද වියදම් වල ද එකතුව නොඉක්මවන මුදලක්, ඒ වරද සමථයට පත් කිරීමේ කොටසක් වශයෙන් ගෙවීම් මත, ඒ බෝට්ටුව, එහි ඇති මසුන් හෝ වෙනත් දෙයක් මුදා හැරීමේ නියමයක් අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ යම් වරදක් සමථයට පත් කිරීම—

(අ) පාර්ශ්ව දෙකෙහි අත්සන් යටතේ වූ ලිඛිත දැන්වීමකින් උචිත මහාධිකරණය වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය;

(ආ) නිත්තිකරු නිදෙස් කිරීමක බලපෑම ඇති විය යුතු ය.

බැඳුම්කරයකට හෝ වෙනත් ඇපයකට යටත් ව බෝට්ටුවක් නිදහස් කිරීම.

21. (1) යම් විදේශීය ධීවර බෝට්ටුවක් සම්බන්ධයෙන් යම් නඩු පැවරීමක් අවසන් කරන තෙක්, ඒ බෝට්ටුව රඳවා තැබීමට මහාධිකරණයක විනිශ්චයකාරවරයා විසින් ආඥාවක් කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ බෝට්ටුවේ අයිතිකරු, අවසර පත්‍ර දරන්නා, යාත්‍රාධිපති හෝ ඒ බෝට්ටුව සම්බන්ධයෙන් පත් කරනු ලැබූ බලය ලත් දේශීය නියෝජිතයා විසින් මේ වගන්තිය අනුව සතුටුදායක බැඳුම්කරයක් හෝ වෙනත් ආකාරයක ඇපයක් සැලසීම පිට බෝට්ටුව මුදාහැරීම සඳහා ඒ අධිකරණය වෙත ඉල්ලුම් කළ හැකි ය.

(2) 13 (5) වන වගන්තියේ අතුරු වගන්තිය අනුව විකුණනු ලැබූ සහ එසේ විකිණීමෙන් ලත් මුදල් අධිකරණයේ තැන්පත් කරනු ලැබූ යම් මසුන්ගේ සහ ජලජ ශාකවල වටිනාකම හැර, තහනමට ගනු ලැබූ අවස්ථාවල දී බෝට්ටුවෙහි වූ මසුන්ගේ සහ ජලජ ශාකවල වටිනාකම සහ එහි වූ සියලු ධීවර ආම්පන්න, උපකරණ, ගබඩාගත බඩු සහ යාත්‍රා බඩු ඇතුළුව බෝට්ටුවේ වටිනාකමේ සහ ඒ බෝට්ටු වෙහි නාවික පිරිසෙහි යම් සාමාජිකයකු හෝ සාමාජිකයන් රඳවා තබා ගැනීමේ දී සහ පෙරළා සියරට යැවීමේ දී ලා දරන ලද වියදමේ සහ ඒ බෝට්ටුවේ යාත්‍රාධිපතිට, අයිතිකරුට හෝ එය කුලියට ගත් තැනැත්

හාට විරුද්ධව නඩුවක් පවරනු ලැබුවේ හෝ පවරනු ලබන්නේ යම් වරදක් සම්බන්ධයෙන් ද ඒ වරද සඳහා ඒ යාත්‍රාධිපති, අයිතිකරු හෝ කුලියට ගත් තැනැත්තා වරදකරු කරනු ලැබූ විට යටත්විය හැකිව තිබූ උපරිම දඩයේ එකතුවට අඩු නොවන ප්‍රමාණයක පිළිගත හැකි බැඳුම්කරයක් හෝ වෙනත් ආකාරයක ඇපයක් විනිශ්චයකාර වරයා විසින් අනුමත කරනු ලැබූ තැනැත්තකු විසින් ලියා අත්සන් කරන ලද විට, බෝට්ටුව මුදාහැරීමට (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීම කරනු ලැබූ මහාධිකරණ විනිශ්චයකාරවරයකු විසින් ආඥාවක් කළ යුතු ය.

(3) මේ වගන්තිය යටතේ ලියා අත්සන් කරනු ලැබූ යම් බැඳුම් කරයක් හෝ වෙනත් ආකාරයක ඇපයක් මුදාහැරීම—

(අ) මේ පනත යටතේ වරදක් සිදු කිරීමේ දී හෝ ඒ සම්බන්ධ යෙන් හෝ බෝට්ටුව පාවිච්චි නොකරන ලද බවට අධිකරණය විසින් කරනු ලබන තීරණයක් මත ; හෝ

(ආ) මේ පනත යටතේ වරදක් සිදු කිරීමේ දී හෝ ඒ සම්බන්ධ යෙන් හෝ බෝට්ටුව පාවිච්චි කරනු ලැබ ඇති බවට අධිකරණය විසින් තීරණය කරනු ලබන අවස්ථාවක—

(i) අධිකරණය විසින් නියම කරනු ලැබූ යම් දඩයක් සහ 18 (ආ) වන වගන්තිය යටතේ ගෙවීමට අණ කරනු ලැබූ යම් ගාස්තු අධිකරණයේ තීන්දුවේ දිනයේ සිට දින දහහතරක් ඇතුළත සම්පූර්ණයෙන් ගෙවීම ; සහ

(ii) (රාජසන්තක කරනු ලැබීමට අණ කරනු ලැබූ සියලු ධීවර ආම්පන්න, උපකරණ, ගබඩාගත බඩු සහ යාත්‍රා බඩු සහ යම් මසුන් හෝ ජලජ ශාක ඇතුළු) බෝට්ටුව එහි වටිනාකමට කිසිදු හානියක් නොමැති ව, අධිකරණයේ ආඥාව අනුව අධිකරණයට භාර දීම හෝ අධිකරණය විසින් නිශ්චය කරනු ලබන පරිදි එහි මූල්‍ය වටිනාකම ගෙවීම

යන කොන්දේසි මත විය යුතු ය.

(4) බැඳුම්කරයක් නිදහස් කරනු ලබන්නේ යම් කොන්දේසි මත ද, ඒ කොන්දේසි නිසි ලෙස ඉටු කළ බව යම් බැඳුම්කරයක් හෝ වෙනත් ආකාරයක ඇපයක් දෙනු ලබන තැනැත්තා හෝ තැනැත්තන් විසින් ඔප්පු කරන්නේ නම් මිස, ඒ බැඳුම්කරය හෝ වෙනත් ආකාරයක ඇපය දුන් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් එක්ව හා වෙන් වෙන්ව රජයට ගෙවිය යුතු ණයක් වශයෙන් ඒ බැඳුම්කරයෙහි හෝ වෙනත් ආකාරයක ඇපයෙහි සඳහන් මුදල නිසි අධිකරණ බලය ඇති යම් අධිකරණයක් විසින් සම්පූර්ණයෙන් අයකර ගනු ලැබිය යුතු ය.

දඩ ආදිය ගෙවන තෙක් බෝට්ටුව රඳවා ගත යුතු බව.

22. 15 වන හෝ 16 වන වගන්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් යම් විදේශීය ධීවර බෝට්ටුවක යාත්‍රාධිපති, අයිතිකරු හෝ කුලියට ගත් තැනැත්තා වරදකරු කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ බෝට්ටුව රාජසන්තක කිරීමට අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබ නැති

නම්, අධිකරණය විසින් ගෙවීමට අණ කරනු ලැබූ දඩය, ගාස්තුව සහ වෙනත් මුදල් ගෙවනු ලබන තෙක් බෝට්ටුවේ ධීවර ආම්පන්න, උපකරණ, ගබඩාගත බඩු සහ යාත්‍රා බඩු ඇතුළුව බෝට්ටුව රඳවා ගත යුතු අතර, දඩය නියම කරනු ලැබූ හෝ ගාස්තු සහ වෙනත් මුදල් ගෙවීමට අණ කරනු ලැබූ දින සිට දින තිහක් ඇතුළත සම්පූර්ණයෙන් ගෙවීම කරනු ලැබ නොමැති නම්, බෝට්ටුව විකිණිය යුතු අතර, විකිණීමෙන් ලත් මුදලෙන්, දඩය, ගාස්තු සහ වෙනත් මුදල් අය කර ගනු ලැබිය යුතු ය.

පූර්ව නිගමන.

23. මුර සංචාරක යාත්‍රාවක් විසින් යම් විදේශීය බෝට්ටුවක් තහනමට ගැනීමෙන් අනතුරුව මේ පනත යටතේ පවරනු ලැබූ යම් නඩුවක දී සිද්ධියක් සිදු වූයේ යයි කියනු ලබන ස්ථානය විසඳිය යුතු ප්‍රශ්නයක් වන අවස්ථාවක, මුර සංචාරක යාත්‍රාවේ, ලොග් පොතෙහි හෝ වෙනත් නිල වාර්තාවක සිද්ධිය සිදු වූ ස්ථානය දැක්වෙන අදාළ සටහනෙහි සහතික පිටපතක සඳහන් ස්ථානය, පටහැනිව කරුණු ඔප්පු කරනු ලබන තෙක්, ඒ සිද්ධිය සිදු වූ ස්ථානය වශයෙන් පූර්ව නිගමනය කරනු ලැබිය යුතු ය.

අධිකරණවල අධිකරණ බලය.

24. ශ්‍රී ලංකා ජල තීරයෙහි සිදු කරන ලද මේ පනත යටතේ වූ යම් වරදක්, මහාධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බලයට අදාළ වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද ශ්‍රී ලංකාවේ යම් අධිකරණ කලාපයක පැවැත්වෙන මහාධිකරණයක් විසින් විභාග කරනු ලැබිය හැකි ය.

දැන්වීම්, සිතාසි හෝ වෙනත් ලේඛන භාරදීම.

25. මේ පනත යටතේ පවරනු ලැබූ යම් නඩුවක හෝ වෙනත් නඩු කටයුත්තක කාර්ය සඳහා යම් දැන්වීමක්, සිතාසි හෝ වෙනත් ලේඛන යම් විදේශීය ධීවර බෝට්ටුවක අයිතිකරු හෝ කුලියට ගත් තැනැත්තා හෝ වෙත භාර දීමට නියම කරනු ලබන අවස්ථාවක, ඒ බෝට්ටුවේ යාත්‍රාධිපති වෙත හෝ ඒ බෝට්ටුවේ අයිතිකරු නැත හොත් කුලියට ගත් තැනැත්තා හෝ විසින් පත් කරන ලද බලය ලත් දේශීය නියෝජිතයා වෙත පෞද්ගලිකව හෝ ලියාපදිංචි තැපෑලෙන් එය භාර දෙනු ලැබුවේ නම් ඒ දැන්වීම, සිතාසිය හෝ වෙනත් ලේඛනය නිසි ලෙස භාර දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

නියෝග සෑදීමට අමාත්‍යවරයා සතු බලය.

26. (1) මේ පනතේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ හා විධිවිධාන බල ගැන්වීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පවරනු ලැබූ බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව විශේෂයෙන් ම පහත දැක්වෙන සියලු කරුණු හෝ ඉන් යම් කරුණක් සඳහා හෝ ඒ සම්බන්ධයෙන් හෝ අමාත්‍ය වරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) ශ්‍රී ලංකා ජල තීරයෙහි මසුන් ඇල්ලීම තහනම් කරනු ලැබූ විට විදේශීය ධීවර බෝට්ටුවල ධීවර ආම්පන්න ගබඩා කරනු ලැබිය යුතු ආකාරය ;

(ආ) 6 වන වගන්තිය යටතේ අවසර පත්‍රයක් සඳහා ඉල්ලීමක ආකෘතිය, එවැනි ඉල්ලීම්වල ඇතුළත් විය යුතු කරුණු සහ එවැනි ඉල්ලීම් ඉදිරිපත් කරනු ලැබිය යුතු ආකාරය ;

(ඇ) 6 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන අවසර පත්‍රවල ආකෘති සහ ඒ සඳහා ගෙවිය යුතු ගාස්තු ;

(ඈ) (i) අවසර පත්‍ර දරන්නන් විසින් මසුන් ඇල්ලීමේ මෙහෙයුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ බලය ලත් දේශීය නියෝජිතයන් හෝ අනුයෝජිතයන් පත් කිරීම ;

(ii) අවසර පත්‍රයෙහි සඳහන් කොන්දේසි සපුරාලීම සඳහා අවසර පත්‍ර දරන්නන් විසින් බැඳුම්කර සහ වෙනත් ආකාරවල ඇප පවත්වාගෙන යාම ;

(iii) අවසර පත්‍රය නිකුත් කරනු ලැබ ඇත්තේ යම් බෝට්ටුවක් සම්බන්ධයෙන් ද ඒ බෝට්ටුව ශ්‍රී ලංකා ජල තීරයෙහි තිබෙන කාලය තුළ ඒ බෝට්ටුව සම්බන්ධයෙන් පිළිපැදිය යුතු නියමයන් ;

(iv) අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් බෝට්ටුවක් සම්බන්ධයෙන් ද ඒ බෝට්ටුව විසින් ලොග් පොත්, බෝට්ටුවේ ගමන් පථය, අල්ලන ලද මසුන් තොග, සහ මසුන් ඇල්ලීම සම්බන්ධයෙන් දරන ලද ප්‍රයත්න පිළිබඳ වෙනත් වාර්තා සහ ඒ බෝට්ටුව විසින් කර ගෙන යනු ලබන ප්‍රවාහන හා සැකසුම් මෙහෙයුම් පිළිබඳ වෙනත් වාර්තා පවත්වාගෙන යාම ;

(v) අල්ලන ලද මසුන් තොග සහ මසුන් ඇල්ලීම සම්බන්ධයෙන් දරන ලද ප්‍රයත්න යන කරුණුවලට අදාළ සංඛ්‍යා ලේඛන ද ඇතුළුව සංඛ්‍යා ලේඛන තොරතුරු සහ වෙනත් තොරතුරු සහ බෝට්ටුවේ ගමන් පථය හා සම්බන්ධ වාර්තා අවසර පත්‍රය දරන්නා විසින් සැපයීම ;

(vi) අවසර පත්‍රය නිකුත් කරනු ලැබ ඇත්තේ යම් බෝට්ටුවක් සම්බන්ධයෙන් ද, ඒ බෝට්ටුවට සළකුණු යෙදීම, බෝට්ටු හඳුනා ගැනීම සහ බෝට්ටු තිබෙන තැන් නිශ්චය කිරීම සඳහා ඒ බෝට්ටුවෙහි සංඥා ප්‍රතිදාන යන්ත්‍ර සහ වෙනත් උපකරණ සවි කොට තබත්තු කිරීම සහ බෝට්ටු තිබෙන තැන් ඒ බෝට්ටු විසින්ම නිශ්චය කර ගැනීම සඳහා ප්‍රමාණවත් යාත්‍රාකරණයට අදාළ යන්ත්‍ර සවි කර තබත්තු කිරීම ;

(vii) අවසර පත්‍රය නිකුත් කරනු ලැබ ඇත්තේ යම් බෝට්ටුවක් සම්බන්ධයෙන් ද ඒ බෝට්ටුවෙහි අභ්‍යාසලාභීන් සහ වෙනත් සේවක පිරිස් රැඳවීම සඳහා අවසර පත්‍ර දරන්නා විසින් පහසුකම් සැලැස්වීම ;

(viii) අවසර පත්‍රය නිකුත් කරනු ලැබ ඇත්තේ යම් බෝට්ටුවක් සම්බන්ධයෙන් ද ඒ බෝට්ටුවෙහි ශ්‍රී ලංකා පුරවැසියන් සේවයෙහි නියුක්ත කිරීම ;

(ix) අවසර පත්‍රය නිකුත් කරනු ලැබ ඇත්තේ යම් බෝට්ටුවක් සම්බන්ධයෙන් ද ඒ බෝට්ටුවෙහි ශ්‍රී ලංකා නිරීක්ෂකයන් රැඳවීම ;

(x) අවසර පත්‍රය නිකුත් කරනු ලැබ ඇත්තේ යම් බෝට්ටුවක් සම්බන්ධයෙන් ද ඒ බෝට්ටුව විසින් මේ පනතින් හෝ යම් වෙනත් නීතියකින් පවරා ඇති බලතල අනුව ක්‍රියා කිරීමේ දී බලය ලත් නිලධර යන් විසින් දෙන ලද විධාන, උපදෙස් හෝ වෙනත් නියමයන් පිළිපැදීම

සම්බන්ධයෙන් වූ කොන්දේසි ඇතුළුව 6 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක සඳහන් කළ යුතු කොන්දේසි ;

(ඉ) හවුල් ව්‍යාපාර යෝජනා ඇතුළු විදේශීය ප්‍රාග්ධන ආයෝජන විසින් පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය ;

(ඊ) අල්ලනු ලැබූ මසුන් තොග පරීක්ෂා කිරීම සඳහා හෝ වෙනත් කාර්ය සඳහා හෝ ශ්‍රී ලංකා තොටුපොළවල් වලට විදේශීය ධීවර බෝට්ටුවලට ඇතුළු වීමට ඉඩ දෙනු ලැබිය යුත්තේ යම් කොන්දේසි මත ද, ඒ කොන්දේසි;

(උ) මසුන් ඇල්ලීම සහ ඊට අදාළ කටයුතු සඳහා පාවිච්චි කරනු ලැබීමට 6 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන අවසර පත්‍රයකින් විදේශීය ධීවර බෝට්ටුවකට අවසර දිය හැකි ශ්‍රී ලංකා ජල තීරය ;

(ඌ) 13 වන වගන්තිය යටතේ විදේශීය ධීවර බෝට්ටුවක් තහනමට ගැනීම ක්‍රියාත්මක කිරීමේ දී බලය ලත් නිල ධරයකු විසින් පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය ;

(එ) මේ වගන්තිය යටතේ සාදන ලද යම් නියෝගයක් කඩ කිරීම හෝ පිළිපැදීම පැහැර හැරීම, ජූරි සභාවක් නොමැතිව මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු විසින් විභාග කරනු ලැබිය යුතු සහ රුපියල් දස ලක්ෂයක් නොඉක්මවන දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතු මේ පනත යටතේ වරදක් විය යුතු බවට විධිවිධාන සැලැස්වීම;

(ඒ) නියම කරනු ලැබීමට මේ පනතින් නියමිත හෝ බලය දෙනු ලැබූ වෙනත් යම් කරුණක්.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දින යෙහි හෝ නියෝගයෙහි සඳහන් කරනු ලබන යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(5) එසේ යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සල කනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

(212 වන අධිකාරය වූ) ධීවර ආඥාපනත සංශෝධනය කිරීම.

27. ධීවර ආඥාපනත පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) ඒ ආඥාපනතේ 5 වන, 6 වන, 7 වන සහ 8 වන වගන්ති ඉවත් කිරීමෙන් ;

(ආ) ඒ ආඥාපනතේ 9 වන වගන්තියෙහි "ධීවර බෝට්ටුව" යන යෙදුම ඒ වගන්තියේ යෙදෙන කවර වූ හෝ අවස්ථාවක දී ඒ වෙනුවට "දේශීය ධීවර බෝට්ටුව" යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ ආඥාපනතේ 10 වන වගන්තියෙහි "ධීවර බෝට්ටුව" යන යෙදුම වෙනුවට "දේශීය ධීවර බෝට්ටුව" යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(ඈ) ඒ ආඥාපනතේ 22 වන වගන්තියෙහි (1) වන උපවගන්තියේ "ධීවර බෝට්ටුව" යන යෙදුම වෙනුවට "දේශීය ධීවර බෝට්ටුව" යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(ඉ) ඒ ආඥාපනතේ 23 වන වගන්තියෙහි (ආ) ඡේදය ඉවත් කිරීමෙන් ;

(ඊ) ඒ ආඥාපනතේ 33 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි—

(i) ඒ උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේද ඉවත් කිරීමෙන් ;

(ii) ඒ උපවගන්තියේ (ඈ) ඡේදයෙහි "ධීවර බෝට්ටුව" යන යෙදුම වෙනුවට "දේශීය ධීවර බෝට්ටුව" යන යෙදුම ආදේශ කිරීමෙන් ; සහ

(iii) ඒ උපවගන්තියේ (ඉ), (ඊ) සහ (උ) ඡේද ඉවත් කිරීමෙන් ;

(උ) ඒ ආඥාපනතේ 35 වන වගන්තියෙහි—

(i) පිළිවෙලින් "ලාංකික", "ලාංකික සමාගම" සහ "ධීවර බලපත්‍රය" යන අර්ථකථන අත්හැරීමෙන් ; සහ

(ii) "අභ්‍යන්තර ජලය" යන අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුලත් කිරීමෙන්—

"දේශීය ධීවර බෝට්ටුව" යන්නට 1979 අංක... දරන ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) පනතෙහි දී ඇති අර්ථය ම ඇත්තේ ය.

අර්ථකථනය.

28. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"ජලජ ශාක" යන්නෙන් යම් මුහුදු ශාකයක්, ප්‍රකාශ ජලවාංගයක් හෝ වෙනත් ජලජ ශාක සංහතියක් අදහස් වේ;

"බලය ලත් නිලධරයා" යන්නෙන් ධීවර ආඥාපනත යටතේ පත් කරනු ලැබූ ධීවර පරීක්ෂකවරයකුගේ පදවියට අඩු නොවන පදවියක් දරන්නා වූ යම් නිලධරයෙක් හෝ නාවික හමුදාවේ සුලු නිලධරයකුගේ පදවියට අඩු නොවන පදවියක් දරන්නා වූ යම් සාමාජිකයෙක්, ගුවන් හමුදාවේ සාජන්ට්වරයකුගේ පදවියට අඩු නොවන පදවියක් දරන්නා වූ යම් සාමාජික යෙක්, සාජන්ට් පදවියට අඩු නොවන පදවියක් දරන්නා වූ යම් පොලිස් නිලධරයෙක් සහ අමාත්‍යවරයා විසින් ලිඛිතව නමින් හෝ ධුරයෙන් එසේ නම් කරනු ලැබූ යම් වෙනත් තැනැත්තෙක් අදහස් වේ;

"අධ්‍යක්ෂවරයා" යන්නෙන් ධීවර ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ ධීවර අධ්‍යක්ෂවරයා අදහස් වේ;

"නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා" යන්නෙන් ධීවර ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ නියෝජ්‍ය ධීවර අධ්‍යක්ෂ වරයෙක් අදහස් වේ;

"මසුන්" යන්නෙන් මත්ස්‍ය වර්ගයට අයත් හෝ අයත් නො වන යම් ජලජ සත්වයකු අදහස් වන අතර යම් කවච මත්ස්‍යයකු, කවචයකු, මුල්ලුස්ක් මත්ස්‍යයකු, හොලෝ තුරියාවා මත්ස්‍යයකු හෝ ජලජ ක්ෂීරපායියකු සහ උගේ කුඩා පැටවකු, බිත්තර හෝ අණ්ඩ පාතනයක් ඊට ඇතුළත් වේ;

"මසුන් ඇල්ලීම" යන්නෙන් යම් ක්‍රමයකින් මසුන් ඇල්ලීම, ගැනීම හෝ මැරීම හෝ ජලජ ශාක රැස්කිරීම අදහස් වන අතර මසුන් ඇල්ලීමට, ගැනීමට හෝ මැරීමට හෝ ජලජ ශාක රැස් කිරීමට ගන්නා ප්‍රයත්නයක් ඊට ඇතුළත් වේ;

"ධීවර බෝට්ටුව" යන්නෙන් ධීවර කටයුතු හෝ ඒ සම්බන්ධ කටයුතු සඳහා තත්කාලයෙහි පාවිච්චි කරනු ලබන යම් යාත්‍රාවක් අදහස් වේ;

"විදේශීය ධීවර බෝට්ටුව" යන්නෙන් දේශීය ධීවර බෝට්ටුවක් නොවන යම් ධීවර බෝට්ටුවක් අදහස් වේ;

"දේශීය ධීවර බෝට්ටුව" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා ආණ්ඩුවට හෝ ශ්‍රී ලංකාවේ යම් නීතියකින් හෝ නීතියක් යටතේ පිහිටුවනු ලැබූ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ සම්පූර්ණයෙන් අයත් වන්නාවූ;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන්නා වූ එක් තැනැත්ත කුට හෝ තැනැත්තන් වැඩි ගණනකට සම්පූර්ණ යෙන් අයත් වන්නා වූ; හෝ

(ඈ) ඡන්දය හිමි කොටස්වලින් වැඩි කොටස් ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විසින් දරනු ලබන්නා වූ ද ශ්‍රී ලංකාවේ නීතිය යටතේ සංස්ථාගත කරනු ලැබූවාවූ හෝ පිහිටුවනු ලැබුවාවූ ද යම් සමාගමකට, සමිතියකට, හෝ වෙනත් පුද්ගල සංගමයකට සම්පූර්ණයෙන් අයත්වූ

සහ 1971 අංක 52 දරන වෙළෙඳ නැව් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ යම් ධීවර බෝට්ටුවක් අදහස් වේ;

"නියමිත" යන්නෙන් මේ පනත යටතේ සාදන ලද නියෝගයකින් නියම කරනු ලැබූ බව අදහස් වේ;

"අදාළ කටයුතු" යන්න ධීවර කටයුතු සම්බන්ධයෙන් යෙදෙන විට—

(අ) යම් බෝට්ටුවකින් හෝ යාත්‍රාවකින් වෙනත් බෝට්ටුවකට හෝ යාත්‍රාවකට මසුන් නැවත පැටවීම;

(ආ) ධීවර මෙහෙයුම්වලින් ලබාගත් මසුන් හෝ ජලජ ශාක ගබඩා කිරීම, සකස් කිරීම හෝ ප්‍රවාහනය කිරීම;

(ඇ) ධීවර බෝට්ටුවලට නැවත ඉන්ධන ඇමීම හෝ සැපයීම හෝ ධීවර මෙහෙයුම්වලට ආධාරකාරී හෝ උපකාරක වූ වෙනත් කටයුතු ඉටු කිරීම;

(ඈ) ඉහත සඳහන් ක්‍රියාවලින් යම් ක්‍රියාවක් කිරීමට ප්‍රයත්නය දැරීම හෝ සූදානම් වීම හෝ

අදහස් වේ;

"ශ්‍රී ලංකා ජලතීරය" යන්නෙන්—

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සාමුද්‍රිය කලාප පිළිබඳ පනතේ 2 වන වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශනයකින් ශ්‍රී ලංකා දේශීය සමුද්‍රය වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ ප්‍රදේශය;

(ආ) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සාමුද්‍රිය කලාප පිළිබඳ පනතේ 4 වන වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශනයකින් ශ්‍රී ලංකාවේ යාබද කලාපය වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ ප්‍රදේශය;

(ඇ) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සාමුද්‍රිය කලාප පිළිබඳ පනතේ 5 වන වගන්තිය යටතේ ප්‍රකාශනයකින් ශ්‍රී ලංකාවේ ස්වසම්පත් කලාපය යනුවෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ ප්‍රදේශය;

(ඈ) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සාමුද්‍රිය කලාප පිළිබඳ පනතේ 9 වන වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශනයකින් ශ්‍රී ලංකාවේ ඓතිහාසික ජල ප්‍රදේශය වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ ප්‍රදේශය; සහ

(ඉ) සියලු පොදු වරායවල්, ගංගා, විල්, කලපු, මෝය, දියපාරවල්, වැව්, ජලාශ, පොකුණු, ඇළවල් සහ වෙනත් සියලු රට මැද පොදු හෝ අභ්‍යන්තර ජල ප්‍රදේශ

අදහස් වේ.